# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 15/2016**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 ඔක්තෝම්බර් මස 4වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>කළමනාකරණ සහකාර සහ කාර්යාල සහායක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි</u>**

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇයගේ එච්ආර්/ඊඑස්ටී/ 01/01/යූජීසි හා 2016.07.20 දිනැති ලිපිය මඟින් අනුපිළිවෙළින් ඇමුණුම I හා II හි දක්වා ඇති කළමනාකරණ සහකාර සහ කාර්යාල සහායක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි සඳහා අනුමැතිය ලබා දී ඇත.

2. අනුමත බඳවා ගැනීමේ පරිපාටි සළකා බැලූ කොමිෂන් සභාව, 2016.09.22 පැවැති සිය 949 වන සභා වාරයේ දී, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2016.10.03 දින සිට එම බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

3. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරුන් / සහකාර මූල්‍යාධිකාරිවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය : යූජීසී/එච්ආර්/2/3/279

ටී /-

ඇමුණුම - I

# කළමනාකරණ සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

| තනතුර සහ වැටුප් කේතය | බඳවා ගැනීමේ ක්‍රමය | සුදුසුකම් |
|---|---|---|
| කළමනාකරණ සහකාර<br>U-MN-1 (III A) | විවෘත (70%)<br>- තරඟ විභාගය<br>සහ<br>- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ) | 01. අ.පො.ස.(සා/පෙළ) විභාගයේ<br>i. සිංහල/ දෙමළ<br>ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය<br>iii. ගණිතය<br>යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරක දී සමත්ව තිබිය යුතුය.<br>සහ<br>02. අ.පො.ස.(උ/පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.) |
| | සීමිත (30%)<br>- තරඟ විභාගය<br>සහ<br>- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ) | 01. අ.පො.ස.(සා/පෙළ) විභාගය දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකට නොඅඩු සංඛ්‍යාවක් සමඟ සමත්ව තිබිය යුතුය.<br>සහ<br>02. ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතුය.<br>සහ<br>03. අදාළ දිනට ප්‍රථමව ප්‍රාථමික මට්ටමේ ස්ථිර පත්වීමක (U-PL වැටුප් කාණ්ඩයේ) අවම වශයෙන් වසර පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුය. |

| | | |
|---|---|---|
| | | සටහන :- යෝග්‍යතාව<br>අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. ( සීමිත බඳවා ගැනීම් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)<br>ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |

**ඇමුණුම II**

# කාර්යාල සහායක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

| තනතුර සහ වැටුප් කේතය | බඳවා ගැනීමේ ක්‍රමය | සුදුසුකම් |
|---|---|---|
| කාර්යාල සහායක<br>U-PL-1 (III) | තරඟ විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරෙනු ඇත. | අ.පො.ස.(සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකට නොඅඩු සංඛ්‍යාවක් සමඟ සමත්ව තිබිය යුතුය.<br><br>සටහන :-<br>අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.<br>ඇ) යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය. |